M.N. නලීමා

මගේ නම නලීමා. මට වයස අවුරුදු තිස් හයයි. මට දරුවන් 05 දෙනෙක් සිටිනවා. මා කුඩා මැටි නිවසක මාගේ දරුවන් හතර දෙනෙක් සහ පස්වන දරුවා කුසේ තියාගෙන සිටින විට මාගේ ස්වාමියා මා අතහැර යනවා. මාගේ පස්වන දරුවා ලැබුනේ ද කුඩා මැටි නිවස තුළදීමයි.

රජරට ප්‍රජා කේන්ද්‍රය ආයතනය මා හට හඳුනා ගැනීමට ලැබෙන්නේ මෙවන් කාලයක් තුළදීය. රජරට ප්‍රජා කේන්ද්‍රයේ ක්‍රියාත්මක පැල්මේරා ව්‍යාපෘතිය හරහා මට සහ දරුවන්ට අවශ්‍ය ආහාර, ඇඳුම් පැළඳුම් ලබා දුන්නා. මගේ දරුවන්ට පෝෂණීය ආහාර වේලක් ලබා දීමට මට හැකියාව ලැබුනා.

මා විවාහ වී සිටියත් මගේ දරුවන් හතර දෙනෙකුට ම උප්පැන්න සහතික තිබුනේ නෑ. මගේ දරුවන්ට උප්පැන්න සහතික ලබාගෙන දරුවන් පාසල් යැවීමට රජරට ප්‍රජා කේන්ද්‍රයේ මිස්ලා උදව් කරා. අද මගේ දරුවන් දිනපතාම පාසල් යනවා. දරුවන්ට පාසල් යාමට අවශ්‍ය නිළ ඇඳුම්, පොත් පත් පැල්මේරා ව්‍යාපෘතියෙන් ලබා දුන්නා.

එය වගේම පැල්මේරා ව්‍යාපෘතිය හරහා මා හට ස්වයං රැකියාවක් ලෙස ගම් කුකුල් පාලනය ලබා දුන්නා. අද මා ගම් කුකුල් පාලනය සිදු කරගෙන යනවා. මාගේ දරුවන්ට ද බිත්තර ආහාරයට එකතු කරලා දෙනවා. එය තුළ මා දරුවන්ගේ පෝෂණය ද සලසා ගන්නවා. ගම් කුකුල් පාලනයට අමතරව මා එළවළු වෙළඳසැලක සේවය කරනවා. එය තුල ලබා ගන්නා ආදායමෙන් මගේ මව සහ දරුවන් පස්දෙනා පෝෂණය කිරීමට මට හැකි වී තිබෙනවා. අද වන විට මා කිසිවෙකුට අත නොපා මගේ දරුවන් රැකබලා ගනිමින් ඉතා සතුටින් ජීවත් වෙනවා.

ඉතා හොඳ සුව පහසු නිවසක ජීවත් වීම මා කුඩා කාලයේ පටන්ම තිබූ සිහිනයක්. මා හට එය සැබෑ කර ගැනීමට නොහැකි වුවත් මාගේ දරුවන්ට හෝ එය ළඟා කරදීම මගේ සිහිනයක් වුණා. එහෙත් මගේ නිවාස සිහිනය සැබෑවක් බවට පත් කර ගැනීමට රජරට ප්‍රජා කේන්ද්‍රය සහ පැල්මෙරා ආයතනය නිසා හැකියාව ලැබුණා. පැල්මෙරා ආයතනය හරහා මා හට ඉදිකර දුන් නිවසේ මගේ දරුවන් ඉතා සතුටින් ආරක්ෂිතව ජීවත් වෙනවා.

රජරට ප්‍රජා කේන්ද්‍රය හා පැල්මෙරා ආයතනය අපි වගේ කාන්තාවන්ට ශක්තියක් වුනු ආයතනයක්. තව තවත් අපි වගේ කාන්තාවන්ට උදව් කරන්න දෙවියන් වහන්සේගේ ශක්තිය ලැබේවා මෙන් ඉල්ලා සිටිනවා.

ජේසු පිහිටයි.